# 1 - ගිණුම්කරණය හා එහි අවශ්‍යතාවය

1.ගිණුම්කරණය යන්නෙන් අදහස් වන්නේ,

1.ගිණුම් ඒකකයක අතීත ගනුදෙනු හා සිද්ධි බාහිර පාර්ශ්ව වෙත ඉදිරිපත් කිරීම.
2.ගිණුම්කරණ ඒකකයක කළමනාකරණ මට්ටමට අවශ්‍ය තොරතුරු සැපයීමේ ක්‍රියාවලියයි.
3.උනන්දුවක් දක්වන පාර්ශවයන්ට තීරණ ගැනීම සඳහා ගිණුම්කරණ ඒකකයට අදාළ තොරතුරු සැපයීමේ සමස්ත ක්‍රියාවලියයි.
4.ගනුදෙනු ලෙජරයට පිටපත් කිරීමේ ක්‍රියාවලිය වේ.

2.මූල්‍යමය තොරතුරක් නොවන්නේ ,

1.ව්‍යාපාරයේ පළමු කාර්තුවේ විකුණුම් වටිනාකම රු.1,200,000කි.
2.ව්‍යාපාරයේ වෙළෙඳ ආයෝජන වටිනාකම රු.300,000කි.
3.පෙර වර්ෂයේ ගෙවූ ආදායම් බදු රු.58,000කි.
4.ව්‍යාපාරයේ සේවක සංඛ්‍යාව 500කි.

3.මූල්‍ය ගිණුම්කරණ ක්‍රියාවලියෙහි පියවරක් නොවේ.

1.සටහන් කිරීම
2.වර්ග කිරීම
3.සාරාංශ කිරීම හා විශ්ලේෂණය
4.අයවැය සැකසීම

4.ගිණුම්කරණ පරිසර සාධකයකි,

1.බාහිර පරිසරය
2.අභ්‍යන්තර පරිසරය
3.සාර්ව පරිසරය
4.ශිල්පීය හා වෘත්තීය පරිසරය

5.ගිණුම්කරණ නිමැවුමක් නොවන්නේ,

1.ආදායම් ප්‍රකාශනය
2.ශේෂ පිරික්සුම
3.මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය
4.හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය

6.ජංගම වගකීම් පමණක් ඇතුළත් කාණ්ඩය තෝරන්න.

1.ණයහිමි,උපචිත වියදම්,උකස් ණය
2.බැංකු ණය,උකස් ණය,ණයකර
3.ණයහිමි,උපචිත වියදම්,කලින් ලද ආදායම්
4.බැංකු ණය,බැංකු අයිරාව,ණයහිමි
7.ආර්ථික හා දේශපාලන පරිසර විචලායකි.

1.ගිණුම්කරණ ප්‍රමිත
2.වෙළෙඳපොල තත්ත්වය
3.පරිගණක තාක්ෂණය
4.සන්නිවේදන තාක්ෂණය

8.ගිණුම්කරණ ක්‍රියාවලියේ නිවැරදි පිළිවෙල වනුයේ,

A - ගනුදෙනු සිදුවීම.
B - ලෙජරයට පිටපත් කිරීම.
C - ගනුදෙනුව මූලික පොත්වල ලිවීම.
D - මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම.
E - ශේෂ පිරික්සුම සැකසීම.
F- තොරතුරු විශ්ලේෂණය කිරීම.

1. ABCEDF
2. ACBEDF
3. ABCFDE
4. ABCFED

9.ගිණුම්කරණ නිමැවුම වන මූල්‍ය වාර්තාවන්ට පදනම් වන්නේ,

1.ගිණුම්කරණ යෙදවුම්
2.ගිණුම්කරණ කාර්යයන්
3.තොරතුරු අපේක්ෂා කිරීම්
4.උපයෝගී පොත්

10.ජංගම නොවන වත්කමක් හා ජංගම වත්කමක් අතර වෙනසක් ඇතිවීමට තුඩු දෙන හේතුවක් නොවන්නේ,

1.ප්‍රයෝජනවත් කාලය
2.මිලට ගැනීමේ අරමුණ
3.ප්‍රබලතාවය
4.මෙහෙයුම් චක්‍රය තුළ විකිණීම සඳහා තිබේද නැද්ද යන වග

**<u>පිළිතුරු</u>**

1. 3
2. 4
3. 4
4. 4
5. 2
6. 3
7. 2
8. 2
9. 1
10. 4

**<u>සකස් කළේ -</u>**

**<u>ඒ.එම්.එම්.සුරංගනී මිය,</u>**
**<u>ර/කුරුවිට ම.ම.වි.</u>**